සිංහල

سنهالي

# تفسير العشر الأخير

## من القرآن الكريم

من كتاب زبدة التفسير

www.tafseer.info

ශුද්ධ අල්-කුර්ආනයේ අවසන් ජුස්උ තුනෙහි අර්ථ විවරණය මෙය තුළ මුස්ලිම්වරුන්ට අවශ්‍ය සියළුම නීති අඩංගුවී ඇත

سنهالي

# ශුද්ධ අල්-කුර්ආනයේ

අවසන් ජුස්උ තුනෙහි අර්ථ විවරණය

මෙය තුළ මුස්ලිම්වරුන්ට
අවශ්‍ය සියළුම නීති අඩංගුවී ඇත.

www.tafseer.info

بسم الله الرحمن الرحيم

# පෙරවදන

**සියළු ප්‍රශංසා අල්ලාහ්ටමය. අල්ලාහ්ගේ අවසාන දූතයාණන්වූ අපගේ නායක මුහම්මද් (එතුමාට ශාන්තිය සමාදානය හිමිවේවා)**

**ඉස්ලාම් සහෝදර සහෝදියනිණී අල්ලාහ් ඔබ සැමට දයාව පහළ කරත්වාෟ නීති හතරක් හැදීම අපගේ යුතුකමකි.**

**1 දැනුම:-** එනම් අල්ලාහ් ගැන ද ඔහුගේ දූතයාණන් ගැන ද ඉස්ලාම් දහම ගැනද දැනගැනීමයි. දැනුමෙන් තොරව අල්ලාහ්ට නැමදුම් ඉටු නොකළ යුතුය. එසේ කීමෙන් මංමුළා විය හැකිය. එය ක්‍රිස්තියානි වරුන්ගේ ක්‍රියාවට සමාන වන්නේය

**2 වතාවත්:-** කවරෙකු දැනුමෙ සහිතව වතාවත් ඉටු නොකරයි ද ඔහු යුදෙව්වන්ට සමාන වෙයි. මන්ද ඔවුන් දැනගත් පිදි වතාවත් ඉටු කලේ නැත. දැනුම නොලද පුද්ගලයා අල්ලාහ්ගෙන් ක්ෂමාව ලැබුවෙකියි විශ්වාසය ඇති කරවා මිනිසාව දැනුම හැදීමෙන් වැළැක්වීම ෂෙයිතාන්ගේ කපටි ක්‍රියාවන්ගෙන් එකකි. කවරෙකුට දැනුම හැදීමට අවස්ථාව තිබිය ්ත් ඔහු දැනුම (ශිල්පය) නොහදාරයි ද ඔහු වරද කරුවෙකුවන අතර එය ඔහුට එරෙහිව සාධකයක් ලෙස පෙනීසිටී. නූහ් නබිතුමාගේ සමාජයේ විසූ ජනයාගේ කපටිකම ද එසේම විය. වරද ඔවුන් කෙරෙහි නොපැටවනු පිණිස (ඔවූහු තම ඇඟිලි කනේ ගසාගෙන තම ඇඳුමෙන් මූහුණු වසාගෙන සිටියහ.)

**3 කැඳවීම:-** ආගමික වියතුන් ද කැඳවුම් කරුවන් ද නබිවරුන්ගේ (අල්ලාහ්ගේ වක්තෘවරුන්ගේ) උරුම (පෙළපත්) කරුවන්ය. අල්ලාහ් බනී ඉස්රායීල්වරුන්ට (යුදෙව්වන්ට)ශාප කලේය. මන්ද (ඔවුන් කළ පාප ක්‍රියාවන්ගෙන් එකිනෙකා වළක්වාගනු නොලැබූහ. ඔවුන් කරමින් සිටියේ නපුරු ක්‍රියාවන්ය.) කැඳවීම ද ශිල්ප ඉගැන්වීම ද පොති අනිවාර්ය (ෆර්ලු කිෆායා) ක්‍රියාවකි. සැලකිය යුතු පිසක් එය ඉටුකරයිනම් කිසිවෙකු පව්කාරයන් හෝ වැරදිකරුවන් නොවෙති. සියළුදෙනාම එම ක්‍රියාව නොකරන්නේනම් සියළුදෙනාම පව්කාරයින්ය.

**4 නිෂ්කරතාවයත් ඉවසා ගැනීම:-** දැනුම සෙවීමේ ¨ හා වත්පිළිවෙත් ඉටු කීමේ ¨ මතුවිය හැකි නිෂ්කරතා ඉවසා ගැනීම.

නුගත් කම ඉවත් කීම සඳහා දායක වීමටත් අවශ්‍ය දැනුම ලබා ගැනීමට පහසුකම් ලබා ¨මටත් සංක්ෂිප්ත මෙම ශුද්ධ කුර්ආනයේ (ග්‍රන්ථයේ) අවසන් (කොටස්) ජුස්උ තුනෙහි අර්ථ විවරණ සහිතව ඉස්ලාම් දැනුමෙහි වැදගත් කොටස් ඇතුළත් කළෙමු. හැකිතරම් කෙටි විය යුතු බවටත්, හ¨ස් (නබි වදන්) සත්‍ය එවා විය යුතු බවටත් දැඩි අවධානය යොමු කර ඇත්තෙමු. අපි සියල්ල ගැන සම්පූර්ණ දැනුම ඇත්තන් යැයි වාද නොකරමු. මන්ද එය අල්ලාහ්ට පමණක් හිමි දෙයකි. එහෙත් මෙය යටහත් පහත් වූ උත්සාහයයකි. නිවැරදි දෑ අල්ලාහ්ගේය. වැරදි ඒවා අපගේ හා ෂෙයිතාන්ගේය. අල්ලාහ් ද ඔහුගේ දූතයාණන් ද ඒ පිළිබඳව නිවැරදි කරුවන්ය. සාධාරණ ලෙස අපගේ වැරදි පෙන්වා ¨ විවේචනය කරන අයට අල්ලාහ්ගේ දයාව හිමිවේවා!

**මෙය සම්පාදනය කීමේ ¨ දණී පිවර්තනයේ ¨ දණී මුද්‍රණය කීමේ¨ දණී බෙදා හැමේ ¨ දණී කියවීමේ¨ දණී ඉගැන්වීමේ¨ ද දායකවන සියලූම දෙනාට අල්ලාහ් යහපත් ප්‍රතිඵල ලබා දෙත්වා! ඔවුන්ගේ උත්සාහයන් පිළිගනිත්වා!**

**සර්ව සම්පූර්ණ දැනුම ඇත්තා අල්ලාහ්මය. අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අපගේ නායකයාණන් හා අල්ලාහ්ගේ දූතයාණන් වන මුහම්මද් තුමණ්ට හිමිවේවා**



ගත කිරීම ඔහුට සුදුසු නැත. (මුස්ලිම්) පසුව පැවසුවේය,නබි(සල්) තුමාණන් මෙය පවසා රාත්‍රියක් ගත නොවූණේය මාගේ වසියාව මා සතුව තිබුනියි.

- ඉමාම්අහ්මද්(රහ්) තුමා පවසයි: මා මාගේ ග්‍රන්ථයේ එක් හදීසයක් හෝ නොලිව්වෙමි එය අමල් කිරීමෙන් තොරව.දවසක් මා-නබි(සල්) තුමාණන් හිජාමා (ප්‍රතිකාරයක් වෙනුවෙන් ඇණ ලේ පිටතට ගැනීම) කර,එය කළ තැනැත්තා වන අබූ ථයිබාහට දීනාරයක් දුන්නේය යන හදීසය ඉගෙන ගත්තෙමි.පසුව මා ද එසේ කර එය කල තැනැත්තාහට දීනාරයක් දුන්නෙමි.
- ඉමාම්බුහාරි(රහ්)තුමා පවසයි: ඊර්ෂ්‍යා කිරීම හරාම් යනුවෙන් මා ඉගෙන ගත් දින සිට කිසිවෙකු හට මා ඊර්ෂ්‍යා නොකලෙමි. තවද මා අල්ලහ් හමු වන දින ඔහු මාගෙන් ඒ හා සම්බන්ධව ප්‍රශ්න නොකිරීම අපේක්ෂා කරමි.
- නබි(සල්) තුමාණන් පැවසුවේය. කවරෙකු සැම සලාතයෙකින් පසුව ආයතුල් කරුසිය පාරායනා කරන්නේ ද,ඔහු ස්වර්ගයට ඇතුලු වීමෙන් මරණය හැර අන් දෙයක් නොවළකියි. (නසාඊ) ඉබ්නුල් කය්යූම්(රහ්) තුමා පවසයි,ෂයිහුල් ඉස්ලාම් ඉබ්නු තෙයිමියා (රහ්) තුමාගෙන් මා හට පුවතක් ලැබුණි. නියතවශයෙන්ම ඔහු අමතකවීමකින් හැර අන් සැම අවස්ථාවේ දී ම එය ක්‍රියා කලේය.

දැනුම ඉගෙන ගැන එය අමල් කිරීමෙන් පසුව අල්ලහ් නුඹට කළ දායාදයන් පිණිස ඒ වෙත කැඳවීම ද නුඹට අවශ්‍යය වේ.මන්ද නුඹ කුසලින් අහිමි නොවන අතර අන් අය ද,යහපතින් අහිමි නොවීම සඳහා ය. නබි(සල්) තුමාණන් පැවසුවේය. කවෙරෙකු යහපතක් සඳහා අන් අයට මග පහදා දෙන්නේ ද,ඔහුට ද එය කරන්නාට ලැබෙන කුසල මෙන් ලැබෙන්නෙය. (මුස්ලිම්) තවද පැවසුවේය.නුඹලාගෙන් වැදගත් අය වනුයේ අල්-කුර්ආනය හදාරා එය සෙස්සන්ට උගන්වන තැනැත්තන්ය.(බුහාරි) තවද පැවසුවේය.මාගෙන් නුඹලා එක් වැකියක් දැනගත්තේ ද,එය අන් අය හට දන්වනු. (බුහාරි,මුස්ලිම්) නුඹ අධිකව යහපත පැතිරවීමෙන්,නුඹගේ කුසල ද මහගු ලෙස අධික වන අතර එය මෙලොව ජීවිතයේ හා මරණයෙන් මතු ජීවිතයේ ඉදිරියට ගමන් කරයි. නබි(සල්) තුමාණන් පැවසුවේය.මිනිසෙකු මරණයට පත්වීමෙන්,අමලයන් තුනක් හැර අන් සියළු අමලයන්ම විසන්ධි වී යන්නේය: නිරන්තර කුලිය පැමිණෙන සදකාව(දන් දීම),ඔහුට ප්‍රයෝජණය ලබාදෙන දැනුම,ඔහු වෙනුවෙන් දුආව අයැදින යහපත් දරුවා. (මුස්ලිම්)

**අවධානය:** අප එක් දිනෙක සූරා ෆාතිහාව 17වරකට වඩා පාරායනා කරන්නෙමු,තවද එහි අල්ලහ්ගේ කෝපයට භාජණය වූවන් හා මංමුළා වූවන්ගේ මාර්ගයෙන් ආරක්ෂා පතන්නෙමු,පසුව අප ඔවුන්ගේ ක්‍රියාවෙන් ඔවුනට සම වන්නෙමු.එනම් අප ඉගෙන ගැන එය ක්‍රියා නොකිරීමෙන් අල්ලහ්ගේ කෝපයට භාජණය වූ යුදෙව්වන්ට ද,දැනුමෙන් තොරව අමල් කර,මංමුළාවූ ක්‍රිස්තියානීන්ට ද සම වන්නෙමු.

මාහට හා නුඹලාහට සර්ව බලධාරී වූ අල්ලහ් ප්‍රයෝජණවත් දැනුම හා යහ අමලයන් කිරීමට අවස්ථා ලබා දෙත්වා! යනුවෙන් ප්‍රාර්ථනා කරමි.

අල්ලහ් ඉතා දැනුම ඇත්තාය.සලවාතය හා සලාමය අපගේ නායක නබි මුහම්මද් (සල්)තුමා හට හා ඔහුගේ ඥාතීන්,හිත මිතුරන් සියල්ලන් හට ඇති වේවා!!!